# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/27 – 2018 මාර්තු 28 වැනි බදාදා – 2018.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ නෙළුදණ්ඩ (56ඩී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහවෙල (අ.ග.පි. 108) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/එච්එල්ඊ/2017/64 හා 2017.06.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඩීන්ලන්ඩ් වත්ත ඇටම්පිටිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1012ක් පමණ**

උතුරට: මාර්ගය සහ අ.ග.පි. 108 හි කැබලි අංක 303; නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 108 හි කැබලි අංක 303; බටහිරට: අ.ග.පි. 108 හි කැබලි අංක 303 සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/ඩබ්එස්/165.
2017 ඔක්තෝබර් මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 - 480